සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ඉස්ලාම් I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. 'සුන්නා' යන පදයෙහි ඉතා නිවැරදි අර්ථය කුමක් ද?
   (1) පරිපාලනය (2) ප්‍රවේශය (3) අත්දැකීම (4) ජීවන මාර්ගය

2. නබිවරුන් සතු ගුණාංග අතුරෙන් 'ඉස්මත්' යන ගුණාංගයෙන් හඳුන්වන්නේ,
   (1) පාපී ක්‍රියා සහ වැරදි ක්‍රියාවල නියැලීමෙන් ආරක්ෂා වී සිටීම ය.
   (2) අල්ලාහ්ගේ දූත පණිවිඩය ගෙන හැර දැක්වීම ය.
   (3) මිනිසුන්ගේ පාප ක්‍රියා සඳහා අල්ලාහ්ගෙන් සමාව අයැදීම ය.
   (4) වේද (ආගම්) පහළවීම ය.

3. අල්කුර්ආනයෙහි 'තව්හීද්' අවධාරණය කෙරෙන තනි සූරාව කුමක් ද?
   (1) සූරතුල් ඉඛ්ලාස් (2) සූරතුල් ෆාතිහා
   (3) සූරතුල් ෆලක් (4) සූරතුන් නාස්

4. නබි (සල්) තුමාණන් පිළිබඳ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
   (1) එතුමා මනුෂ්‍ය හා ජින් යන දෙවර්ගයටම එවන ලද පොදු නියෝජිතයා වේ.
   (2) එතුමා මදීනා සිට මක්කාවට 'හිජ්රත්' කළේ ය.
   (3) එතුමා නබිවරයා සහ රසූල්වරයා ලෙස එවන ලදී.
   (4) එතුමා උලුල් අස්මිවරුන්ගෙන් කෙනෙකි.

5. 'අකීදා' ක්ෂේත්‍ර පිළිබඳ ඉස්ලාමීය විද්වතුන් ප්‍රධාන විශ්වාසයට අයත් කරුණු කොටස් හතරකට බෙදා පැහැදිලි කර ඇත. ඒ අතුරෙන්, මෙලොව ඇසටත් ඉන්ද්‍රියන්ටත් ගෝචර නොවන මලක්වරුන්, ජින්වරුන්, ෂෙයිතාන්වරුන් සහ රූහ් යනාදිය අඩංගු වන කොටස වන්නේ,
   (1) අල් ඉලාහියියාත් ය. (2) අන් නුබුව්වාත් ය.
   (3) අස් සම්ඉයියාත් ය. (4) අර් රූහානියියාත් ය.

6. අබුල් හසන් අල් අෂ්අරි (රහ්) තුමා පහත සඳහන් දාර්ශනික කොටස් අතුරෙන් කුමන කොටසට අයත් වේ ද?
   (1) මුඃතසිලා (2) ජබරියියා
   (3) මුර්ජිආ (4) අහ්ලුස් සුන්නා වල් ජමාආ

7. වේද (ආගම්) පහළවීමට පෙර රසූල්වරුන් කිහිපදෙනෙකුට ලබා දී තිබූ සුහුෆ්වල සංඛ්‍යාව 110 වේ. සුහුෆ් ලද වුන් අතර අල් කුර්ආනයේ සඳහන් වනුයේ දෙදෙනෙකු පමණි. ඔවුන් දෙදෙනා වන්නේ,
   (1) ඉබ්රාහීම් (අලෛ) සහ මූසා (අලෛ) ය. (2) ආදම් (අලෛ) සහ මූසා (අලෛ) ය.
   (3) ඉද්රීස් (අලෛ) සහ ඉබ්රාහීම් (අලෛ) ය. (4) මුහම්මද් (සල්) සහ ෂීද් (අලෛ) ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**8.** පේෂ කර්මාන්තය හඳුන්වා දුන්නේ නබි ඉද්රීස් (අලෛ) යැයි පවසන ඉස්ලාමීය ඉතිහාසඥයා වන්නේ,
(1) වස්සාෆ් ය. (2) අල්වාහිදි ය. (3) ඉබ්නු කල්තුන් ය. (4) අල්තහාබි ය.

**9.** ක්‍රි.ව. 1864 වර්ෂයේ මහාධිකරණ නීතිඥයෙකු ලෙස උසස්වීම් ලැබ මහනුවර නගර සභා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස සේවය කළේ කවුරුන් ද?
(1) විනිසුරු අක්බර්
(2) මුහම්මද් කාසිම් සිද්දි ලෙබ්බෙ
(3) මුහම්මදු ලෙබ්බෙ
(4) ආචාර්ය බුර්හානුද්දීන් ජායා

**10.** පහත වගුවේ '**අ**' තීරුවේ කුලෆාඋර් රාශිදූන්වරු හතරදෙනාගේ නම් ද '**ආ**' තීරුවේ ඔවුහු තම කිලාෆත් පරිපාලන කාල පරිච්ඡේදයේ කළ වැදගත් සේවා හා දායකත්ව ද සඳහන් කර ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | අබූබක්ර් (රළි) | A - නාවික හමුදාව පිහිටුවීම |
| (2) | උමර් (රළි) | B - සුප්‍රසිද්ධ ව්‍යාකරණ මහාචාර්යවරයකු වන අබුල් අස්වද් අද්දුඅලි ලවා අල්කුර්ආන් අක්ෂර සඳහා පිල්ලම් යෙදවීම |
| (3) | උස්මාන් (රළි) | C - සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසගේ කුමන්ත්‍රණය බිඳ දැමීම |
| (4) | අලී (රළි) | D - හිජ්රි කැලන්ඩර් වර්ෂය හඳුන්වාදීම |

ඉහත '**අ**' තීරුව සමඟ '**ආ**' තීරුව නිවැරදි අනුපිළිවෙළට ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B, C, D (2) A, C, B, D (3) B, A, C, D (4) C, D, A, B

**11.** 'ඉජ්තිහාද්' යනු කුමක් ද?
(1) ඉස්ලාමීය විද්වතුන්ගේ ඒකමතික තීරණය
(2) උලමාවරුන්ගේ උපදේශක සභාව
(3) ඉස්ලාමීය නීති ආයතන
(4) ගැටළුවකට විසඳුම් සොයා ගැනීමට උත්සාහ කිරීම

**12.** තමා යම් තනතුරකට පත් කරන්න යැයි ඉල්ලා සිටි විට, "ඔබ දුබල පුද්ගලයෙකි. තනතුරක් යනු අතිවිශාල වගකීමකි. තනතුරට සුදුසු පුද්ගලයා එය ලබාගෙන එහි රාජකාරි ඉටු නොකළහොත් එලොවේ දී දුක සහ පසුතැවිල්ලට එය හේතුවක් වේ" යනුවෙන් නබි (සල්) තුමාණන් විසින් පවසන ලද්දේ කුමන සහාබිවරයාට ද?
(1) උස්මාන් (රළි)
(2) මුආවියා (රළි)
(3) මුආද් ඉබ්නු ජබල් (රළි)
(4) අබූදර් අල් කිෆාරි (රළි)

**13.** "මට පසු මුසාවාදීන් ... දෙනෙක් බිහි වෙති. සියල්ලෝ ම තමන් නබිවරුන් බවට විවාද කරති. එහෙත්, මම නබිවරු සියල්ලන්ටම අවසානයා ලෙස සිටිමි. මගෙන් පසු වෙනත් කිසිඳු නබිවරයෙකු නොමැත්තේ ය." (අබූදාවුද්) මෙම හදීස් හි සඳහන් වන මුසාවාදීන්ගේ සංඛ්‍යාව වන්නේ,
(1) 10 කි. (2) 20 කි. (3) 30 කි. (4) 40 කි.

**14.** "එක් කද්රයකින් තවත් කද්රයකට අපි ගමන් කරන්නෙමු." යැයි පැවසූ සහාබිවරයා කවුරුන් ද?
(1) අබූබක්ර් (රළි) (2) උමර් (රළි) (3) උස්මාන් (රළි) (4) අලී (රළි)

**15.** හජ් ක්‍රියාවලියේ ඉටුකළ යුතු, උම්රා ක්‍රියාවලියේ අඩංගු **නොවන** 'ෆර්ල්' කුමක් ද?
(1) ඉහ්රාම් ඇඳීම
(2) හිස කෙස් ඉවත් කිරීම
(3) අරෆාවෙහි රැඳීම
(4) සඊ ඉටු කිරීම

**16.** බුහාරි ග්‍රන්ථයේ ඇතුළත් හදීස් සංඛ්‍යාව වන්නේ,
(1) 4000 යි. (2) 4341 යි. (3) 4800 යි. (4) 7275 යි.

**17.** අලි (රළි) ඝාතනය කළ තැනැත්තා වන්නේ,
(1) අබුලුඃලුආ ය.
(2) අබු ජහ්ල් ය.
(3) අබ්දුර් රහ්මාන් ඉබ්නු මුල්ජිම් ය.
(4) උබෙ ඉබ්නු සලූල් ය.

**18.** පහත ඒවා අතුරෙන් වුළූ කිරීමට භාවිත කළ **නොහැකි** ජලය වන්නේ,
(1) තැඹිලි වතුර ය.
(2) මුහුදු ජලය ය.
(3) ගංගා ජලය ය.
(4) වැව් ජලය ය.



Department of Examinations Sri Lanka

19. "මුඃමින්වරුන් අතුරෙන් යහපත් තැනැත්තා යහගුණ ඇත්තා වේ." යන්න
(1) අල් කුර්ආන් වාක්‍යයකි. (2) නබි වාක්‍යයකි.
(3) උමර් (රලි) ගේ ප්‍රකාශයකි. (4) අබූ හුරෛරා (රලි) ගේ ප්‍රකාශයකි.

20. ෂාෆිඊ මද්හබය රාජ්‍ය මද්හබය ලෙස ප්‍රසිද්ධියට පත් කළේ ඊජිප්තුවේ කුමන පාලකයාගේ පාලන සමයේ ද?
(1) කලීෆා දෙවෙනි හකම් (2) සුල්තාන් සලාහුද්දීන්
(3) කලීෆා මුතවක්කිල් (4) කලීෆා හාරූන් අර්රෂීද්

21. නබිතුමාණන් සඳහන් කර ඇති පරිදි, විවාහ වීමට ශක්තිය නොමැති තරුණයන් තමන් ආරක්ෂා කර ගැනීමට කළ යුතු 'අමල්' යන නැමදීම වන්නේ,
(1) දන් දීම යි. (2) උම්රා ඉටු කිරීමයි.
(3) උපවාස ශීලය රැකීමයි. (4) සලාත් ව්‍යාප්ත කිරීමයි.

22. 'කියාස්' යන පරිපූරක මූලාශ්‍රයේ මූලික කරුණු (රුකුන්) කීයද?
(1) දෙකයි (2) තුනයි (3) හතරයි (4) පහයි

23. "නෆ්සුල් අම්මාරා බිස්සූඃ" යන්නෙහි අර්ථය වන්නේ,
(1) පාප ක්‍රියා කිරීමට අනුබල දෙන මනස ය. (2) තමා කෙරෙහි පශ්චාත්තාප වන මනස ය.
(3) සන්සුන් මනස ය. (4) අල්ලාහ් විසින් පිළිගනු ලබන මනස ය.

24. නබි (සල්) තුමාණන් තම සහචරයින් ආරක්ෂා කිරීම පිණිස ඔවුන් හබශාවට යැවූ අවස්ථාවේ ඔවුන්ව ආරක්ෂා කළ රජු වන්නේ,
(1) මුකව්කිස් ය. (2) නජ්ජාශි ය. (3) හිර්කල් ය. (4) වාසියස් ය.

25. පෘථිවියේ අල්ලාහ්ගේ නියෝජිතයෙකු ලෙස සිට, එය පරිපාලනය කිරීම යන අර්ථය පෙන්නුම් කරන අරාබි පදය වන්නේ,
(1) ඉමාරත් ය. (2) ඉබාදත් ය. (3) කිලාෆත් ය. (4) අමානත් ය.

26. 'ජාමිඋල් කුර්ආන්' යන නාමය හිමි වූ කලීෆා කවුරුන් ද?
(1) අබූබක්ර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

27. ක්‍රි.ව. 8 වන සියවසේ ශ්‍රී ලංකාවේ මිය ගිය අරාබි වෙළෙඳුන් කිහිපදෙනෙකුගේ වැන්දඹුවන් හා අනාථ දරුවන් අරාබියට යැවූ ලාංකීය රජතුමා කවුරුන් ද?
(1) දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා (2) දෙවෙනි බුවනෙකබාහු රජතුමා
(3) දෙවෙනි අග්බෝ රජතුමා (4) දෙවෙනි ධාතෝපතිස්ස රජතුමා

28. "ආගමික නීතිරීති දන්නා අය පමණක් අපගේ වෙළෙඳපොළ ගනුදෙනු කටයුතුවල නිරත වන්න, නො එසේ නම් වෙළෙඳපොළට එන්න එපා" යනුවෙන් පැවසූ සහාබිවරයා කවුරුන් ද?
(1) අලි (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) ඉබ්නු අබ්බාස් (රලි)

29. මෙලොව දී කළ දාමරිකකම් පිළිබඳ දිනපතා කරන ලද ප්‍රකාශවල දී ඉබ්ලීස් බෙහෙවින් සතුටට පත්වෙන්නේ කුමන ක්‍රියාකාරකම පිළිබඳව ද?
(1) පවුල වෙන් කිරීම (2) පොළිය දිරිමත් කිරීම
(3) මත්පැන් පානය කිරීමට බල කිරීම (4) හූනියම් කිරීම

30. පහත ඒවායින් තහනම් කරන ලද වෙළෙඳ කටයුත්තක් වන්නේ කුමක් ද?
(1) අල් මුලාරබා ය. (2) අල් ඉජාරා ය.
(3) අල් මුෂාරකා ය. (4) අර්රිබා ය.

31. පහත සඳහන් අය අතුරෙන් පුරුෂයෙකුට විවාහ වීම සඳහා අනුමත කරන ලද කාන්තාවක වන්නේ,
(1) බිරිඳගේ මව ය. (2) නැන්දාගේ දුව ය.
(3) පුතාගේ බිරිඳ ය. (4) සහෝදරයාගේ දුව ය.

32. සකාත් නිසාබ් තත්ත්වයට පත් වී තිබෙන අවස්ථාවක දී ශ්‍රී ලංකා රු. 2 000 000 (ලක්ෂ විස්සක්) තමා ළඟ තිබෙන අයෙක් වර්ෂ අවසානයේ ලබාදිය යුතු සකාත් ප්‍රමාණය වන්නේ,
(1) රු. 20 000 කි. (2) රු. 30 000 කි. (3) රු. 40 000 කි. (4) රු. 50 000 කි.

33. යමෙක් එකවර තලාක් තෙවරක් පවසා තම බිරිඳ දික්කසාද කිරීම
(1) තලාක් බිද්අ් නම් වේ. (2) තලාක් සුන්නි නම් වේ.
(3) තලාක් රජ්ඊ නම් වේ. (4) අල්කුල්උ නම් වේ.



Department of Examinations Sri Lanka

**34.** පහත සඳහන් පද කෙරෙහි අවධානය යොමු කරන්න.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | ෆර්ලු | A - මත්පැන් පානය කිරීම |
| (2) | හරාම් | B - ජනාසා සම්බන්ධ වගකීම් |
| (3) | ෆර්ලු කිෆායා | C - සලාම් පැවසීම |
| (4) | සුන්නත් | D - පස්වේල සලාතය |

ඉහත 'ආ' තීරුවේ තිබෙන පද 'අ' තීරුවේ තිබෙන පදවලට අනුව සුදුසු ආකාරයෙන් ගළපා ගන්නා විට ලබාගත හැකි නිවැරදි පිළිතුර වන්නේ,

(1) A, C, B, D ය. (2) B, C, A, D ය. (3) D, A, B, C ය. (4) D, A, C, B ය.

**35.** නිශ්චිත කාලසීමාවක් තුළ ජීවත් වන මුජ්තහිද්වරුන්ගෙන් කෙනෙකු හෝ සමහරුන් යම් සුවිශේෂී ප්‍රශ්නයක දී ගනු ලබන තීරණය පිළිබඳ කිසිවක් ප්‍රකාශ නොකර නිහඬව සිටී. එම තීරණය කෙසේ හැඳින්වේ ද?

(1) ඉජ්මාඋස් සුකූති (2) ඉජ්මාඋල් අක්සරියියා
(3) ඉජ්මාඋස් සරීහ් (4) ඉජ්මාඋල් කව්ලි

**36.** පහත සඳහන් පද කෙරෙහි අවධානය යොමු කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | මුතවාතිර් | B | තවාෆ් | C | කිරාන් |
| D | හරම් | E | රයියාන් | F | අරෆා |
| G | අර්රිබා | H | ඉජාරා | I | සව්ම් |

ඉහත වගුවේ උපවාසය හා හජ් නැමදීමට අදාළ **නොවන** පද පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A, B, D වේ. (2) A, G, H වේ. (3) D, E, F වේ. (4) F, G, H වේ.

**37.** "සුබ්හාන රබ්බියල් අඃලා වබිහම්දිහී" යන දික්ර් සලාත් පාරායනය කරනුයේ කුමන අවස්ථාවේ ද?

(1) සුජූද් කිරීමේ දී (2) රුකූඋ කිරීමේ දී
(3) මැද ඉඳුමට පැමිණීමේ දී (4) සලාම් පැවසීමෙන් පසු

**38.** පහත සඳහන් වගුවේ 'අ' තීරුවේ නබි (සල්) තුමාණන් සමග සම්බන්ධවූවන්ගේ ගෞරව නාම සහ 'ආ' තීරුවේ ඒවාට අදාළ අර්ථයන් සඳහන් කර ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | අහ්ලුල්බෛත් | A - වහී සටහන් කරන්නෝ |
| (2) | උම්මහාතුල් මූඃමිනීන් | B - නබිතුමාණන්ගේ පවුලේ අය |
| (3) | අස්හාබුස්සුෆ්ෆා | C - නබිතුමාණන්ගේ භාර්යාවන් |
| (4) | කුත්තාබුල්වහී | D - පිළේ මිතුරෝ |

ඉහත 'අ' තීරුව 'ආ' තීරුව සමග නිවැරදිව ගළපා ඇති පිළිතුර ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D (2) B, C, D, A (3) D, C, A, B (4) D, C, B, A

**39.** 'අහ්ලුස්සුන්නා වල්ජමාආ' යනුවෙන් සඳහන් වන්නේ,

(1) පෙර සිටි නබිවරුන් පිළිපදින්නන් ය.
(2) නබි (සල්) තුමාණන් සහ එතුමාගේ සහාබාවරුන්ගේ ජීවන මග එසේම පිළිපදින්නන් ය.
(3) නොමග යන වැරදි මතවාදයන් පිළිපදින්නන් ය.
(4) අල්කුර්ආනය පමණක් පිළිපදින්නන් ය.

**40.** 'ශ්‍රී ලංකාවට ඉස්ලාම් දහම මුල් කාල පරිච්ඡේදයේම හඳුන්වා දුන්නකි' යන්නට සාක්ෂි වශයෙන් සඳහන් **නොවන්නේ,**

(1) අබ්බාසිය කලීෆා විසින් කාලිද් ඉබ්නු බකායා යන දේශකයාව කොළඹට යැවීමයි.
(2) ක්‍රි.ව. 715 වන වර්ෂයේ දී සින්ධු ප්‍රදේශය මුහම්මද් බින් කාසිම් විසින් අත්පත් කරගැනීමයි.
(3) අරාබිවරුන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ග්‍රීක සහ රෝමානුවන් ශ්‍රී ලංකාවට පැමිණීමයි.
(4) වහාබ් ඉබ්නු අබී හෆ්සා නමැති නබි මිතුරා නබි (සල්) තුමාණන්ගේ පණිඩිවය රැගෙන චීනයට යාමයි.

* *

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

**ඉස්ලාම් I, II**
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) සුබ්හු සලාතයට පසුව 'කලිමතුත් තව්හීද්' පාරායනය කරන අයෙකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ii) මිඃරාජ් ගමනින් පසුව ජිබ්රීල් (අලෛ) තුමා ඉමාම්වරයෙකු ලෙස කටයුතු කරමින් මුහම්මද් (සල්) තුමාණන්ට කොපමණ දවසක් සලාතය ඉගැන්නුවේ ද?

(iii) කලීෆා උමර් (රලි) තුමාගේ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙන ලදැයි, යන උපකල්පනයට පදනම් වූ ඉතිහාසඥවරයා කවුරුන් ද? ඔහු ලියූ ග්‍රන්ථය කුමක් ද?

(iv) "හජ් වාජිබ් වූ, මරණයට පත් වූ පියා වෙනුවෙන් අපට හජ් කළ හැකි යැයි" පැවසූ නබි (සල්) තුමාණන්, එය කුමන ක්‍රියාව සමග සසඳා පැහැදිලි කළේ ද?

(v) කෘෂිකර්මාන්තයේ යෙදීම සහ ඒ වෙනුවෙන් පොළොව සාරවත් කිරීම යන ක්‍රියාවන් අවධාරණය කොට නබි (සල්) තුමාණන් පැවසූ උපදෙස්වලින් **එකක්** සඳහන් කරන්න.

(vi) සලාතයේ සුජූද් කිරීමේ දී පොළොව ස්පර්ශ කළ යුතු අවයව ගණන කීයද?

(vii) ප්‍රධාන මද්හබ් **දෙකක්** නම් කර, ඒවායේ නිර්මාතෘවරුන් සඳහන් කරන්න.

(viii) 'උම්මත්' යන පදයෙහි තේරුම භාෂාමය හා සමාජීය දෘෂ්ටිකෝණයෙන් ලියා දක්වන්න.

(ix) අල්කුර්ආනයේ සාහිත්‍යමය විශිෂ්ටත්වය ඉදිරියේ තම නොහැකියාව පිළිගත්, එවකට ඉස්ලාමයට එරෙහිව සිටි කවියන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(x) "සැක නැති දේ පිළිපදින්න" යනුවෙන් පැවසූ නබි (සල්) තුමාණන් සැකයට මගපාදන දෑ කෙසේ හැසිරවීමට උපදෙස් ලබා දුන්නේ ද?

**2.** (i) දේශපාලන අරමුණකින් තොරව, අකීදාව පදනම් කරගෙන බිහි වූ දාර්ශනික කොටස් **දෙකක්** සඳහන් කරන්න.

(ii) අනෙකුත් නබිවරුන්ට වඩා මුහම්මද් (සල්) තුමාණන්ට පමණක් ලබාදෙන ලද සුවිශේෂී ගුණාංග **හය** සඳහන් කරන්න.

(iii) ජීවිතයේ මධ්‍යස්ථභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරන නබි (සල්) තුමාණන්ගේ දිවියේ සිදුවීමක් පැහැදිලි කරන්න.

**3.** (i) එක් පුද්ගලයෙකුට විවාහවීම සඳහා තාවකාලිකව තහනම් කරන ලද **දෙදෙනෙකු** සඳහන් කරන්න.

(ii) ඉස්ලාමීය දෘෂ්ටියට අනුව විවාහයේ අරමුණු **තුනක්** සඳහන් කරන්න.

(iii) 'ඉද්දා' යනු කුමක් දැයි සඳහන් කර, කාන්තාවක් එය ඉටුකිරීමෙන් ලබන ප්‍රතිලාභ **තුනක්** පිළිබඳ විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**4.** (i) රමලාන් මස 'ෆර්ල්' යන අනිවාර්ය උපවාසය අතහැර වෙනත් දිනවල උපවාසය ඉටුකිරීමට සහනයක් ලබාදුන් **දෙපිරිස** සඳහන් කරන්න.

(ii) හජ් හා උම්රා ඉටු කිරීමේ දී තහනම් කරන ලද ක්‍රියාවන් **තුනක්** සඳහන් කරන්න.

(iii) අබුබකර් (රලි) කලීෆා ධූරයට පත් වූ පසුව ඔහු විසින් ඉටුකරන ලද සේවාවන් **පහක්** පැහැදිලි කරන්න.

**5.** (i) දයාව දැක්වීම යන ගුණාංගය හා සම්බන්ධ අල්ලාහ්ගේ නාමයන් **දෙකක්** සඳහන් කරන්න.

(ii) කෙනෙක් තවත් කෙනෙකු කෙරෙහි දයාව දැක්වීමෙන් ලබාගන්නා වූ ප්‍රතිලාභ **තුනක්** සඳහන් කරන්න.

(iii) උම්මත් යන ව්‍යූහය ආරක්ෂා කිරීමට අල්කුර්ආනය හා සුන්නාව ලබා දී ඇති මගපෙන්වීම් **පහක්** සඳහන් කරන්න.

**6.** (i) එකෙක් කල් මක්කමේ තම දෑවාවට සහයෝගය ලබා දී, එකම වර්ෂයේ මරණයට පත් වූ නිසා නබි (සල්) තුමාණන් දැඩි ලෙස කම්පනයට ලක්කළ **දෙදෙනා** කවුරුන් ද?

(ii) නබි (සල්) තුමාණන්ගේ ආගමික දේශනය නවතාලීමට කුරෙෂිවරුන් විසින් හසුරුවන ලද ක්‍රියාදාමයන් **තුනක්** සඳහන් කරන්න.

(iii) 'සීරත් රසූලුල්ලාහ්' ආරක්ෂා කිරීම සඳහා මුල් කාල වකවානුවල කරන ලද ඇතැම් ගවේෂණාත්මක උත්සාහයන් **තුනක්** පිළිබඳ පැහැදිලි කරන්න.

**7.** පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** ගැන කෙටි සටහන් ලියන්න.

(i) පවිත්‍රතාවයේ වැදගත්කම

(ii) වෙළෙඳාමේ බඩු භාණ්ඩ සැඟවීම

(iii) මස්ජිදුන් නබවී

(iv) පාරිසරික සාරධර්ම පිළිපැදීම

* * *

Department of Examinations Sri Lanka